පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව- 2010
---------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2010 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සංරචකයක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව, කාලච්ඡේදය ආරම්භයේ හා අවසානයේ දේපල පිරියත උපකරණවල ධාරණ අගයන්ගේ සැසඳීමක් ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති පිරිවැය රු.3,131,511 ක් හා සමුච්චිත ක්ෂය රු.240,178 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

2008 වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.5,000,000 ක ස්ථාවර තැන්පතු සඳහා තැන්පතු සහතිකය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර රු.806,849 ක තැන්පතු පොළී ආදායමෙහි නිවැරදිතාවය තහවුරුකරගැනීමට අදාල සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

1.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සභාව විසින් 2007 හා 2008 වර්ෂවලදී රු.9,992,823 ක් හා රු.5,000,000 ක් පිළිවෙලින් |

| | |
|---|---|
| | භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 | එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.2,034,970 ක් වූ පරිගණක සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.1,096,540 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා නියාමන සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.970,888 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,437,715 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.466,827ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ආදායම රු.1,761,000 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2007, 2008, 2009 හා 2010 වර්ෂවල සභාවේ දායකත්වය පිළිවෙලින් රු.11,168,903 ක්, රු.6,711,807 ක්, රු.2,871,214 ක් හා රු.2,530,453 ක් වූයෙන් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට දායකත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 40 කින්, සියයට 57 කින් හා සියයට 12 කින් පිරිහී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීම, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ පිරිනමනු ලබන හෝ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම, සියළු පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස්

පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීම යන සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමට, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදී හා එම ලියාපදිංචිවීම් අලුත් කිරීමේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් විසින් අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු නියමු උපදේශන පිළියෙල කිරීමට සහ සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැරකිරීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික වෛද්‍ය ආයතන 419 ක් පමණක් ලියාපදිංචි කර තිබුණු අතර ඉකුත් වර්ෂයේදී ලියාපදිංචි සංඛ්‍යාව 602 සමඟ සැසඳීමේදී එම සංඛ්‍යාව සියයට 30 කින් අඩුවී තිබුණි. ලියාපදිංචි කළයුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් කරන ලද කාර්යයන් වල ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වර්ෂ හතරක ප්‍රමාදයක් සහිතව 2016 ජනවාරි 04 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 4.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ළඟාකර ගැනීම සඳහා වර්ෂ 03 කට නො අඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද නියාමන සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.5 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.6 අයවැය ලේඛනමය පාලනය

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව, අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.